# විකාලයෙහි කැප පාන වර්ග

1. අඹ පානය ( අම්බපානං )
2. ජම්බු පානය ( ජම්බුපානං )
3. ඇට සහිත කෙසෙල් පානය (චොචපානං )
4. ඇට රහිත කෙසෙල් පානය ( මොචපානං )
5. මී පැණි පානය ( පැන් මිශ්‍ර කළ යුතු ය ) ( මධුපානං )
6. මිදි පානය ( මුද්දිකපානං )
7. ඕලු / නෙලුම් / මානෙල් ගෙඩි පානය ( සාලූකපානං )
8. මසන් පානය ( ඵාරුසකපානං )

- දිවුල් පානය
- අලිගැටපේර පානය
- පේර පානය
- සියඹලා පානය
- දොඩම් / නාරං පානය
- නෙල්ලි පානය
- වෙරළු පානය
- දෙලුම් පානය
- උක් පානය
- පැපොල් පානය
- අන්නාසි පානය
- බෙලි පානය
- ස්ට්‍රෝබෙරි පානය
- ඇපල් පානය
- ලොවි පානය
- උගුරැස්ස පානය
- මොර පානය
- රඹුටන් පානය
- මැංගුස් පානය
- උක් හකුරු දියකර සදන පානය
- පුෂ්ප රස ( මධූක-මී පුෂ්ප හැර )
- පත්‍ර රස ( එළවලු පත්‍ර හැර )

මෙම පාන වර්ග සැදීමේදී පළතුරු වර්ග ගෙන අතින් මැඩ ( හෝ Blender කර ), ඇල් පැන් / සීතල පැන් මිශ්‍ර කර, සීනි / හකුරු / ලුණු ආදිය සුදුසු පරිදි යොදා, ( කුඩා කැබලි වත් නොසිටින සේ ) හොඳින් පෙරා පූජාකිරීම කැපය. අව්වෙන් කකාරා පූජාකිරීම ද කැපය. ගින්නෙන් රත් කර පූජාකිරීම අකැපය.

උතුම් වූ භාග්‍යවතුන් වහන්සේ ජීවමානව වැඩ වාසය කරන බව සිතින් අරමුණු කර මහත් වූ සද්ධාවෙන් මහත් වූ ගෞරවයෙන් උසස් ම ආකාරයෙන් තම තමාට හැකි උපරිම මට්ටමින් රාජාධිරාජයෙකුට දක්වන ගෞරවයට වඩා වැඩි ගෞරවයක් දක්වා කර්ම ඵල අදහා පූජා කර දෙලෝ වැඩ පිණිස ද නිවන අවබෝධවීම පිණිස ද හේතු වාසනා වේවා යැයි ප්‍රාර්ථනා කළ යුතු.

## විකාලයෙහි අකැප පාන වර්ග

තල් / පොල් / වරකා / දෙල් / ලබු / කොමඩු / පුහුල් / පිපිඤ්ඤා / කැකිරි වැනි පාන වර්ග
අනෝදා පානය / දූරියන් පානය / එළවලු යූෂ වලින් සදාගත් පාන වර්ග සහ සුප් වර්ග
ධාන්‍ය රස ( Milo / Nestomalt ආදී මෝල්ට් වර්ග ), කිරි සහිත / පිටි සහිත පාන වර්ග

**ආනිසංස -** සොවාන්, සකදාගාමි, අනාගාමි, අර්හත් ඵල රසයන් විපාක වශයෙන් ලැබීම